සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**12 ශ්‍රේණිය** | **නාට්‍ය හා රංග කලාව** | **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(1) | 2 -(1) | 3 -(2) | 4 -(1) | 5 -(3) | 6 -(2) | 7 -(1) | 8 -(3) | 9 -(2) | 10-(1) |
| 11-(4) | 12-(3) | 13-(3) | 14-(1) | 15-(2) | 16-(3) | 17-(5) | 18-(4) | 19-(1) | 20-(1) |
| 21-(5) | 22-(2) | 23-(4) | 24-(3) | 25-(2) | 26-(2) | 27-(1) | 28-(2) | 29-(3) | 30-(4) |
| 31-(1) | 32-(1) | 33-(3) | 34-(5) | 35-(2) | 36-(1) | 37-(2) | 38-(1) | 39-(4) | 40-(2) |

## II කොටස

### A කොටස

(01) (i)

- උඩරට සම්ප්‍රදාය :
  කොහොඹා කංකාරිය, වලියක් මංගල්‍යය, කඩවර කංකාරිය, බලි ශාන්ති කර්ම.
- පහතරට සම්ප්‍රදාය :
  දෙවොල් මඩු, දහඅට සන්නිය, රට යැකුම, සූනියම් යාගය, ගම්මඩු, බලි.
- සබරගමු සම්ප්‍රදාය :
  පහන් මඩු, කිරි මඩු, පුනා මඩු, කුමාර සමයම.

ශාන්ති කර්ම නම් කොට තිබීම. (ල.03)

(ii) සම්ප්‍රදායන් තුන අතුරෙන් කැමති ශාන්ති කර්මයක් නම් කොට නාට්‍යමය අවස්ථාවක් පිළිබඳ සවිස්තරාත්මකව දක්වා තිබීම. (ල.06)

(iii)

- පහන් මඩුව : පත්තිනි, සමන් දෙවියන් ප්‍රධාන කොට පැවතීම. වසංගත රෝග හා සශ්‍රීකත්වය උදෙසා පැවත්වීම. දෙවොල් ගොඩ බැසීම, කුරුම්බර නැටීම, හත් පදය, අසුර යක්කම, රාම මැරීම, අඹ විදමන, නාට්‍යමය පෙළපාලි ලෙස දැක්විය හැකි බව.
- කිරි මඩුව : මංගර දෙවියන් හා පත්තිනි දෙවියන් පුද ලබයි. විෂ්ණු, කතරගම, සමන්, දැඩිමුණ්ඩ දෙවිවරු ද පුද ලබයි. භව භෝග සම්පත්, සශ්‍රීකත්වය ලඟා කරලීම සඳහා පවත්වයි. ඇත් බන්ධනය, මී බන්ධනය, මුරුතැන් තැබීම, මංගර සමයම, අංඩිගුරු නැටීම ආදී නාට්‍යමය අවස්ථා ඇතුළත් බව.

ආදිය හා උපත් කතා දක්වා තිබීම. (ල.06)

(02) (i)

- ආකෘතියේ මෙන් ම අන්තර්ගතය පිරීම.
- නාඩගමට විරුද්ධව මතු වූ සමාජ මතවාද.
- කථා වස්තු තුළ අවර ගණයේ චරිත ඇතුළත් වීම.
- ඒකාකාරී රාගතාල, ගීත, දුර්වල සංගීතය.
- නූර්ති ආගමනය, පූර්ව රංගනයකින් දිනපතා ආරම්භය. (ල.04)

(ii)

- රාගධාරී සංගීතයෙන් යුක්ත වූ ගීත.
- රංග කලා තුළ වේදිකාගත වීම.
- කාලය පැය 02, 03 කට සීමා වීම.
- ස්ත්‍රී භූමිකා ස්ත්‍රීන් විසින් ම රංගනය කිරීම.
- ජාතික අනන්‍යතාව සුරකෙන පරිදි නූර්ති නාට්‍ය රචනා වීම. (ල.05)

(iii) ජෝන් ද සිල්වා, චාල්ස් ඩයස් වැන්නවුන්ගේ අභාවයත් සමඟ නූර්ති පරිහානියට පත්විය. අත්දැකීම් අඩු පිරිස් නූර්ති රචනයට පෙළඹීම, චිත්‍රපට ජනප්‍රියවීම, නිෂ්පාදකවරු, නළු නිළියන් චිත්‍රපට වලට අවතීර්ණ වීම, බටහිර ඉංග්‍රීසි භාෂාව ව්‍යාප්ත වීමෙන් සිංහල භාෂාව කොන්වීම, මිනිසුන්ගේ රසඥතාව වෙනස්වීම. උගත් සමාජයට නාට්‍ය නිර්මාණය කෙරුනත් සාමාන්‍ය ජනතාව අතර ඒවා ප්‍රසිද්ධ නොවීම...... යනාදී කරුණු සිංහල නාට්‍ය කලාව කෙරේ බලපා ඇති බව ලියා තිබීම. (ල.06)

(03) (i) බීජ, බිංදු, පතාකා, ප්‍රකරි, කාර්ය නිදසුන් මඟින් පැහැදිලි කිරීම. (ල.04)

(ii) (ල.05)

(iii) ඉතිවෘත්තය කතා වස්තුවයි. ආධිකාරික, ප්‍රාසාංගික වශයෙන් දෙවදෑරුම් ය. ඒ පිළිබඳ විස්තර කිරීම. (ල.06)

## B කොටස

(04) (i) සජීවී කලාවක් වීම, වේදිකාවක් තුළ ඉදිරිපත් කිරීම, සජීවීව ඉදිරිපත් කරන මොහොතේ දී පමණක් පැවතීම, තර අභිනය භාවිතය, ආදී වූ කරුණු දක්වා තිබීම. (ල.04)

(ii) සංගීතය, නර්තනය, බැලේ, ඔපෙරා, මුද්‍රා ආදිය නම් කොට වෙනස් කම් දක්වා තිබීම. (ල.05)

(iii) ප්‍රාසාංගික කලා නම් කොට ඒ අතුරින් නාට්‍ය කලාවට ලැබෙන ස්ථානය දක්වා තිබීම. (ල.06)

(05) (i) කාල ඒකීයත්වය, ස්ථාන ඒකීයත්වය, කාර්ය ඒකීයත්වය නම් කොට කෙටියෙන් දක්වා තිබීම. (ල.04)

(ii)
- කතා වස්තුව දිග හැරීම ආරම්භ වන්නේ උදෑසන වන අතර අවසන් වන්නේ හවස් වරුවේ ය.
- සියලු ම සිදුවීම් කීබිස් මාලිගය ඉදිරිපිට සිදුවෙයි.
- වේදිකාවේ කළ හැකි දෑ පමණක් තෝරාගෙන ඇත.

ආදිය නාට්‍යයක් ඇසුරෙන් නිදහසුන් සහිතව දක්වා තිබීම. (ල.05)

(iii) කතා වස්තුව, චරිත නිරූපණය, චින්තනය, වාග් විලාසය, ප්‍රේක්ෂාව, සංගීතය දක්වා කෙටියෙන් විස්තර කොට තිබීම. (ල.06)

(06) (i) පුරා වෘත්තය දක්වා තිබීම. (ල.04)

(ii)
- දුෂ්‍යන්ත රජු අසපුවේ දී මුවාට වීමට තැත් කිරීමේ දී එය වළකාලමින් සිදු කරන ආංගිංසනය රජුගේ චරිතවත් බව.
- පුරාවෘත්තයට වඩා චරිත කතාවට එක් කොට තිබීම.
- සකුන්තලා, දුෂ්‍යන්ත රජු ප්‍රේම වෘත්තාන්තයට පැමිණෙන බාධා ආදිය මඟින් රස ජනනය කිරීමට උත්සහ ගෙන ඇත.
- පරිසරය පිළිබඳ ඉතා දීර්ඝ විස්තර ගෙන එයි. එය නාට්‍ය ධර්මී ලක්ෂණයකි. ශෝකී අවස්ථාවක් මඟින් ප්‍රේක්ෂක අවධානය නොබිඳා නාට්‍ය අවසානය කරා ගෙන ඒමට උත්සහ ගෙන ඇත. ආදී වූ කරුණු හා සිසුවාගේ පිළිතුර මත ලකුණු ලබා දෙන්න. (ල.05)

(iii) තර්කානුකූල විග්‍රහයක් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.06)

(ලකුණු 15 × 4 = 60 යි)